# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

## අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කිරීම - 2024

පහත සඳහන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු වී ඇති බැවින්, එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

1. නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
2. සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

**02. සුදුසුකම්**

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 5ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

ii. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු කාලය තුල සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

**03. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

i. මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, 2024.07.09 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **“සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල”** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ii. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **“පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා ඉල්ලුම් කිරීම”** යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් $2x2^1/_2$ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

**04. ක්‍රමවේදය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව මඟින් පත් කරනු ලැබේ. (පළාත් ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයකුද ඇතුළත් වේ).

05. අදාළ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

06. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

2024.06. 18

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු වලට පත් කිරීම - 2024**

**(ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණිය)**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොදා ගැනීමට අනුමත ලකුණු පරිපාටිය**

**1. ජ්‍යෙෂ්ඨතාවය** **උපරිම ලකුණු 30**

ශ්‍රී ලං.අ.ප.සේ. සේවා ව්‍යවස්ථාව ප්‍රකාර මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති I ශ්‍රේණියේ වසර 5ක සතුටුදායක සේවා කාලයට අතිරේකව ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව මෙම ලකුණු ලබා දෙනු ලැබේ.

ඒ අනුව, අදාළ තනතුරට ඉල්ලුම් කරන නිලධාරීන් අතුරින් ඉහත පරිදි වැඩිම අතිරේක සේවා කාලයක් (ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ වසර 5ක සතුටුදායක සේවා කාලයට අතිරේකව) සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද, සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

**සටහන :** ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ වසර දෙක (02) ක සේවා කාලයක් සහිතව II හා III ශ්‍රේණි වල වසර 12කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර 02ට වඩා වූ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ද I ශ්‍රේණියේ සේවා කාලයක් සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.

**2. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද** **උපරිම ලකුණු 15**

(අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ)

2.1 පාසල් කළමණාකරණයේ පළපුරුද්ද ලකුණු 10
(ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අනුමත විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 1 බැගින්)

2.2 කාර්යාල කළමණාකරණයේ පළපුරුද්ද ලකුණු 10
(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්)

**3. අධ්‍යාපන සුදුසුකම්** **උපරිම ලකුණු 10**

| | | |
|---|---|---|
| 3.1 | දර්ශනශූරී (PhD) | - ලකුණු 10 |
| 3.2 | දර්ශනපති (M Phil) | - ලකුණු 07 |
| 3.3 | පශ්චාත් උපාධිය | - ලකුණු 05 |
| 3.4 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 03 |

(කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන අතර එක් සහතිකයකට / ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. තව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය වෙතින් හදාරා ඇති සේවා ව්‍යවස්ථාවේ සඳහන් වන හෝ අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් අදාළ ලකුණු ලබා දෙනු ලැබේ)

**4. නිර්මාණශීලීත්වය හා වෘත්තිය සංවර්ධනය** **උපරිම ලකුණු 15**

4.1 වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ලකුණු 10

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කරන ලද විධිමත්ව අවසන් කරන ලද එක් පර්යේෂණ වාර්තාවකට ලකුණු 05 බැගින් උපරිම පර්යේෂණ 02ක් සඳහා ලකුණු දෙනු ලැබේ)

4.2 ප්‍රකාශයට පත් කර ඇති සඟරා, ලිපි, ප්‍රකාශන ආදිය ලකුණු 5

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් අනුමැතිය ලද ග්‍රන්ථ සඳහා පමණක් ද පුවත්පත් හා සඟරා වල පළ කර ඇති ලිපි, වාර්තා හෝ ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේදී අධ්‍යාපන ලේකම් විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සුදුසු යැයි තීරණය කරනු ලබන ප්‍රකාශන සඳහා ද එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 03ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ)

**5. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** **උපරිම ලකුණු** 05

(මෘදුකාංග, භාවිත මෘදුකාංග හැසිරවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම හා පරිගණක දෘඪාංග පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කර බලනු ලැබේ)

**6. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** **උපරිම ලකුණු** 05

(ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳව ප්‍රායෝගික භාවිතය හා නිපුනතාවය පරීක්ෂා කර බලනු ලැබේ.)

**7. සේවා ඇගයීම් / ප්‍රශංසා සහතික / සම්මාන සහතික / ජයග්‍රහණ** **උපරිම ලකුණු** 05

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 01 බැගින් උපරිම සේවා ඇගයීම් 05ක් සඳහා

**සටහන : (දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වේ)**

**8. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු** 10

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති සහ 21 වැනි සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග පිළිබඳ අවධානය යොමු කරමින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු ලෙස අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳව, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර, **එම ඉදිරිපත් කිරීමට** අදාළ දෘශ්‍ය පිටපතක් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

එම ඉදිරිපත් කිරීම සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

I. ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 2
II. අන්තර්ගතය - ලකුණු 2
III. කාල කළමනාකරණය - ලකුණු 2
IV. ඉදිරිපත් කිරීමේ විලාශය - ලකුණු 2
V. නිගමනය හා නිමාව - ලකුණු 2

**9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ථ කුසලතාව** **උපරිම ලකුණු** 05

**100**

2"X 2½"

**ආදර්ශ අයදුම්පත**

**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය - 2024**

**"අ" කොටස**

1. 1.1 සම්පූර්ණ නම (සිංහලෙන්) පූජ්‍ය / මයා / මිය / මෙනවිය
......................................................................................................................................
......................................................................................................................................
(ඉංග්‍රීසියෙන්)
......................................................................................................................................
......................................................................................................................................

1.2 නම (පත්වීම් ලිපියේ සඳහන් ආකාරයට)
......................................................................................................................................
......................................................................................................................................

2. 2.1 උපන්දිනය: අවුරුද්ද [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

2.2 වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) : අවුරුදු [ ][ ][ ][ ] මාස [ ][ ] දින [ ][ ]

2.3 ස්ත්‍රී / පුරුෂ භාවය : ..............................................................................................

3. (ලිපිනයන් පැහැදිලි ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. ලිපි තැපැල් කළ යුතු ලිපිනය X ලකුණෙන් දක්වන්න.)

3.1 රාජකාරි ලිපිනය:
......................................................................................................................................
......................................................................................................................................
......................................................................................................................................

3.2 රාජකාරි දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

3.3 ස්ථිර ලිපිනය :
......................................................................................................................................
......................................................................................................................................
......................................................................................................................................

3.4 පෞද්ගලික දුරකථන අංකය:

ස්ථාවර [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ජංගම [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

5. ශ්‍රී ලං.අ.ප. සේවයට පත්වීමේ ස්වභාවය :.......................................................................
(විවෘත / සීමිත / ජ්‍යෙෂ්ඨතා කුසළතා / වෙනත් පදනම මත)

6. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් වූ දිනය: ..........................................................................

7. 7.1 දැනට දරණ තනතුර: ......................................................................................................

7.2 එම තනතුරේ රාජකාරී භාරගත් දිනය: ..................................................................................

8. අධ්‍යාපන සුදුසුකම් (පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධිය / දර්ශනපති / දර්ශනශූරී):

| | උපාධිය / ඩිප්ලෝමාව | ලබාදුන් ආයතනය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9. පාසල් කළමණාකරනයේ පළපුරුද්ද:

| පාසලේ නම | පාසල් වර්ගීකරණය (ශ්‍රී ලං.අ.ප.සේ. I / ශ්‍රී ලං.අ.ප.සේ. II/III) | පළාත | විදුහල්පති ලෙස කටයුතු කළ කාලසීමාව | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | | | | |
| | | | | |
| | | | | |

10. කාර්යාල කළමණාකරනයේ පළපුරුද්ද (විදුහල්පති තනතුරු හැර)

| තනතුර | තනතුර අයත් ශ්‍රේණිය | කාල සීමාව | | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

11. ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් :

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

12. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන පළාත් (මනාපය අනුව පිළිවෙලින් සඳහන් කරන්න)

| | පළාත |
|---|---|
| 01 | |
| 02 | |

ඉහත සඳහන් කළ තොරතුරු නිවැරදි බවත්, පසුගිය අවුරුදු පහ (5) ඇතුළතදී නියමිත වැටුප් වර්ධක මවිසින් උපයා ගෙන ඇති බවත්, කිසිදු විනයානුකූල දඬුවමකට භාජනයවී නොමැති බවත් සහතික කරමි.

.................................... දිනය

.................................... අයදුම්කරුගේ අත්සන

## "ආ" කොටස

**අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව භාර ආසන්නතම මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන පූජ්‍ය ..................................... හිමි / මයා / මිය /මෙනෙවිය,

1. අංක 1 සිට 12 දක්වා ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි / වැරදි වේ.

2. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීම් ලද......................... දින සිට 2024 ……. ….. දින දක්වා අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත.

   එසේ අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු

| කාලය | අඩ වැටුප් නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|
| ........... සිට ............ දක්වා | ...... අවු ...... මාස ...... දින | ...... අවු ...... මාස ...... දින |
| ........... සිට ............ දක්වා | ...... අවු ...... මාස ...... දින | ...... අවු ...... මාස ...... දින |
| ........... සිට ............ දක්වා | ...... අවු ...... මාස ...... දින | ...... අවු ...... මාස ...... දින |

3. ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත.

   වැටුප් වර්ධක විලම්බනය කර ඇත්නම් එසේ කිරීමට කිරිමට හේතු :

| විලම්බන කාලය | හේතුව |
|---|---|
| ........... සිට ............ දක්වා | |
| ........... සිට ............ දක්වා | |
| ........... සිට ............ දක්වා | |

4. ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු විනය, විගණන හෝ විමර්ශන ඇත / නැත.

   එසේ විනය, විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

| වර්ෂය | විනය / විගණන / විමර්ශන ද යන්න | එහි වත්මන් තත්වය |
|---|---|---|
| | | |
| | | |
| | | |

**(** චෝදනා පත්‍ර / විනය නියෝග නිකුත් කර ඇත්නම් ඒවායෙහි සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්ය වේ.)**

5. ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත / නැත.

6. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් යටතේ වන අවශ්‍යතාවයන් සපුරා ඇත / නැත .

7. උසාවියකින් දඬුවම් ලබා ඇත / නැත.

............................ ..................................................

දිනය නම , අත්සන හා නිල මුද්‍රාව

## "ඇ" කොටස

***පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහැර ඇති නිලධාරීන් සඳහා**

**පළාත් අධ්‍යාපන ලේකම්,**

ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව පූජ්‍ය ..................................... හිමි / මයා / මිය /මෙනෙවිය ........................ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට ඉල්ලුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.............................                                        ..................................................

දිනය                                        පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අත්සන හා නිල මුද්‍රාව)

---

**ප්‍රධාන ලේකම්,**

**....................................... පළාත,**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන පූජ්‍ය ....................................... හිමි / මයා / මිය /මෙනෙවිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරකට / තනතුරු වලට ඉල්ලුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි. තවද එම නිලධාරියා / නිලධාරිනිය මෙම තනතුර සඳහා තෝරා පත් කර ගනු ලැබුවහොත් ................................ පළාත් රාජ්‍ය සේවයෙන් අනුප්‍රාප්තිකයෙකු රහිතව නිදහස් කිරීමට එකඟ වෙමි / නොවෙමි.

.............................                                        ....................................................

දිනය                                        පළාත් අධ්‍යාපන ලේකම් (අත්සන හා නිල මුද්‍රාව)

---

**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන පූජ්‍ය ....................................... හිමි / මයා / මිය /මෙනෙවිය ................................ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරකට / තනතුරු වලට ඉල්ලුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි. එම නිලධාරියා / නිලධාරිනිය මෙම තනතුර සඳහා තෝරා පත් කර ගනු ලැබුවහොත් .......................... පළාත් රාජ්‍ය සේවයෙන් අනුප්‍රාප්තිකයෙකු රහිතව මුදා හැරීම සුදුසු බව නිර්දේශ කරමි / නොකරමි.

.............................                                        ..............................................................

දිනය                                        ප්‍රධාන ලේකම් (අත්සන හා නිල මුද්‍රාව)

## "ඇ" කොටස

****ජාතික පාසල් වල / විභාග හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා**

**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**

ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව පූජ්‍ය ...................................... හිමි / මයා / මිය /මෙනෙවිය ...................................... පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරකට / තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

................................ ......................................................

දිනය                                        දෙපාර්තමේන්තු ප්‍රධානී / අති.ලේ. (අ.සේ.ආ)
(අත්සන හා නිල මුද්‍රාව)